# ජූඩ් ගේ සංගීත දිවියට තිස් වසරයි

## නව වසර සැමරීමට ඕස්ට්‍රේලියාවෙන් සංගීත කණ්ඩායමක් ලංකාවට





Esric


Camaron


Sandra


Chris




David

ඔහු තාල වාදනයේ නව මං සොයා වෙහෙසෙන නිර්මාණශීලී තාල වාදන ශිල්පියකු බැව් ඕස්ට්‍රේලියාවේ සහ ශ්‍රී ලංකාවේ සංගීත හිතකාමී සැවොම හඳුනාගෙන හමාරය. ලොව නවතම සංගීත ප්‍රවණතා ගවේශනය කරමින් ගීතයකට අවශ්‍ය සැබෑ තාල වාදනය කුමක්දැයි ඔහු නිබඳව පෙන්වා දෙයි. ගොරහැඩි ප්‍රසංගික වේදිකාවේ පවා ඔහු ඩ්‍රම්ස් වාදනය තුළින් ප්‍රේක්ෂකයාට අපූරු මිහිරක් ලබා දෙයි.

බඹරා මල නොතලා රොන් ගන්නා සේ සිය ඩ්‍රම්ස් වාදනයෙන් රස ජනනය කරන්නට ඔහු සමත්වෙයි. එපමණක් නොව ඔහුගේ දැනුම නව පරපුරට ලබා දීමටද ඔහු පසුබට නොවෙයි. පසුගියදා පැවැත්වූ රොක්ස්බර්ග්පාක් මිල්පාක් භාෂා පාසලේ රන්තරු විවිධ ප්‍රංගයේදී අපේ දරු දැරියන් පිරිසක් මෙහෙයවා නිර්මාණය කරන ලද අප්‍රිකානු ඩ්‍රම්ස් වාදනය සහ කැලිප්සෝ සංගීත නිර්මාණය ප්‍රසංගය නැරඹූ සැම දෙනාටම නවමු අත්දැකීමක් විය. එයින් පසක් වන්නේ ඔහුගේ මග පෙන්වීම යටතේ අනගතයේ අපූරු ඩ්‍රම්ස් වාදකයන් පිරිසක් අප අතරින් බිහිවන බව බවයි.

ඔහුගේ සංගීත දිවියට මේ වසර අවසන් වන විට අවුරුදු තිහක් සැපිරෙයි. අවුරුදු 30ක කාලයක් සංගීත ක්ෂෙත්‍රයේ රැඳෙමින් තමහන්ගේ හැකියාව ලොවට පෙන්වමින් ඩ්‍රම්ස් වාදනය ඔහුගේ ජීවිතයේ


ශ්‍රීනාත් මැද්දුමගේ

කොටසක් කරගත් අපූරු පුද්ගලයෙකි ජූඩ්. මෙල්බර්න් නුවර සංගීත ලෝලීන්ට සතුටු විය හැකි කාරණයක් වූයේ ජූඩ් මෙල්බර්න් පුරවරයේ ස්ථිර පදිංචියට පැමඅණීමයි. බොහෝ ශිල්පීන් ලංකාවෙන් ඕස්ට්‍රේලියාට සංක්‍රමණය වුවත් එසේ සංක්‍රමණය වන ශිල්පින්ගෙන් වැඩි ප්‍රයෝජනයක් මෙල්බර්න් පුරයට ලැබෙන්නේ නැත. නැත්නම් ලබාගන්නේද නැත. නමුත් බොහෝ දක්ෂ කලවේ පරතෙරට ගිය ශිල්පීන් බොහෝ පිරිසක් මෙහි නිහඬව ජීවත්වෙති. නමුත් ජූඩ් ප්‍රනාන්දු මෙහි ආ දා සිටම සිය සේවය ශ්‍රී ලාංකික ප්‍රජාවට දායාද කරන්නට උත්සාහ කළේය. එසේම ඔහුගේ සේවය ලබා ගැනීමටද ශ්‍රී ලාංකික සංගීත කණ්ඩායම් නිරතුරුවම උත්සාහ ගන්නා අයුරුදු අපි නිරීක්ෂණය කළෙමු.

ජූඩ් ගේ සංගීත දිවියේ අවුරුදු 30 සපුරන්නේ අමතක නොවන ආකාරයකිනි. ඒ ගැන විමසන්නට අපි පසුගියදා ජූඩ් හමුවීමු.

**මොකක්ද මේ අපූරු සිදුවීම?**

දෙසැම්බර් 31 වන දා ලංකාවේ සංගීථ කණ්ඩායම් වලට ඉතාමත් කාර්ය බහුල දිනයක්. ඒ වගේම තරු පන්තියේ පිළිගත් සෑම හෝටලයකම මේ දවසේ රාත්‍රියේ සංගීත ප්‍රසංග පැවැත්වෙනවා. ලංකාවේ නමගිය සංගීථ කණ්ඩායම් සියල්ලම මෙදින මෙම ප්‍රසංග සඳහා ආරාධනා ලබනවා. කොළඹ ගලධාරි හෝටලයේ මේ වසරාවසාන දිනයේ පැවැත්වෙන සංගීත ප්‍රසංග සංගීතවත් කරන්නට මෙල්බර්න් නුවර රී ප්ලේ සික්ස් සංගීත කණ්ඩායමට ආරාධනා ලැබිලා තියෙනවා. එම කණ්ඩායමේ මමත් සාමාජිකයෙක්. පළමු වතාවට මෙල්බර්න් සංගීත කණ්ඩායම ශ්‍රී ලංකාවේ දෙසැම්බර් 31 රාත්‍රී ප්‍රසංගයක් සංගීතවත් කරන මේ අවස්ථාව මට වැශේසයෙන් වැදගත් එකක්.

**ඔබ ආ ගමන ගැන පොඩි විස්තරයක් කරමුද?**

මං මුලින්ම පාසල් යන කාලයේ සිටම ඩ්‍රම්ස් වාදනයට කැමැත්තක් තිබුණා. පසු කාලයක සංගීත කණ්ඩායම් කීපයකම ඩ්‍රම්ස් වාදන ශිල්පියකු ලෙස එක්වන්නට මට අවස්ථාව ලැබුණා. සමණලයෝ සුපර් සොනික් සුපර් ෆෝචූන්ස් සියැක් මේරියන්ස් යන සංගීථ කණ්ඩායම් ඒ අතර තියෙනවා. 1993 සිට 2005 දක්වා මා සම්බන්ධව සිටියේ මේරියන්ස් කණ්ඩායමටයි. 2005 දී මම ඇමරිකාව බලා ගියා.

**ඇමරිකාවට ගියේත් සංගීතයට සම්බන්ධ කටයුත්තකටද?**

ඔව් එහේ සංගීත කණ්ඩායම් කීපයක් මට ආරාධනා කළා ඔවුන් සමග එක්වන ලෙස. මම අවුරුදු දෙකක් ඔවුන් සමග ඇමරිකාවේ සංගීත කණ්ඩායම් වලට සම්බන්ධව සිටියා. ඒ අත්දැකීම සුවිශේස එකක්. එහිදී මා අත්දුටු වැදගත්ම දෙය තමයි ලෝකයේ සිටින සුපිරි සංගීත=යන්ග් සන්දර්ශන පැවැත්වෙන ආකාරය හා සංවිධානය වන ආකාරය දැක බලා ගන්නට ලැබීම.

මම ඉන් පසුව ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වුණා.

**මේ ලංකා සංචාරයේදි ඔබ වෙනත් සංගීත කටයුතු වලටත් සම්බන්ධ වෙනවද?**

තවත් එක් අපූරු සිදුවීමක් තියෙනවා. ඒ තමයි අපි කවුරුත් දන්න ඩෙස්මන් සිල්වා සංගීත ශිල්පියා ගේ සංගීත දිවියට වසර 50ක් පිරීම නිමිත්තෙන් දෙසැම්බර් 28 වන දා මියුසියස් විද්‍යාල ශාලාවේදී පැවැත්වෙන සංගීත ප්‍රසංගයට සංගීතය සපයන්නටත් ඊස්ට්‍රිකා ගේ නායකත්වයෙන් යුත් රී ප්ලේ සික්ස් සංගීත කන්ඩායමට අවස්ථාව ලැබිලා තියෙනවා. එය අපට ලැබුණ තවත් සුවිශේෂ අවස්ථාවක්.

**ඔබේ සංගීත කන්ඩායම ගැන යමක් පවසන්න පුලුවන්ද?**

ඔව්. මෙල්බන් නුවර බටහිර සංගීත කන්ඩායම් අතර ඉදිරියෙන්ම සිටින කණ්ඩායමක් තමයි රී ප්ලේ සික්ස් සංගීත කන්ඩායම. එස්රික් ජැක්සන් ගේ නායකත්වයෙන් සැන්ඩ්‍රා ජැක්සන් කැමරන් කොළඹගේ ක්‍රිස්ටෝපර් මන්ටි ලින්ඩ්සේ ඩේවිඩ් ට්‍රේවෝ සොනියා කාපිලි සහ මම මේ කණ්ඩායමට ඇතුළත් වෙනවා.

**ඉදිරි සංගීත කටයුතු කොහොමද?**

මම ඉදිරියේදී ඩ්‍රම්ස් වාදනය පුහුණු කිරීම සඳහා පන්තියක් ආරම්භ කරන්නට කටයුතු යොදා තියෙනවා.

පසුගියදා පැවැත්වුණ රොක්ස්බර්ග් පාක් මිල්පාක් සිංහල භාෂා පාසලේ වාර්ශික විවිධ ප්‍රසංගයේදී ජූඩ් ප්‍රනාන්දු ඉදිරිපත් කළ අපූරු ඩ්‍රම්ස් වාදන අංගයක් රස විඳීමේ අවස්ථාව මට හිමි වුණා. දරුව දැරියන් පිරිසක් ලවා ඔහු ඉදිරිපත් කළ මේ අංග දෙක නරඹන කාගේත් පැසසුමට ලක්වුණා. සිය හැකියාවන් දෙවන පරපුරකට දායාද කරන්නට ජූඩ් දැක්වූ සමත්කම එහිදී කතා බහට ලක් වුණා.

ජූඩ් ඩ්‍රම්ස් වාදනයේ අති දක්ෂයෙකි. ඔහුගේ වාදනය අසා සිටීම සේම බලා සිටීමද ආශ්වාදයකි. මේ නිහතමානී කලාකරුවා ගේ තිස් වසරක කලා දිවිය සමරණ මේ මොහොතේ අපේ සුභාශිංෂණයද මෙසේ ඔහුට හිමිවෙයි.

## ලක්මිහිර වෙබ් අඩවිය ළඟදීම




සෑම බ්‍රහස්පතින්දාවකම සවස 6 සිට 8 දක්වා එෆ් එම් 88.6 ඔස්සේ ඔබ සොයා එන ලක් මිහිර ගුවන්විදුලිය වෙනුවන් සකස් කෙරුණ වෙබ් අඩවිය www.lakmihira.com.au දෙසැම්බර් මාසයේදී අන්තර්ජාලයට එක්වෙයි.

ශ්‍රී ලංකාවේ පුවත් රූපවාහිනී සේවා ටෙලි නාට්‍ය ආදී සියලුම අංග ලක්මිහිර වෙබ් අඩවිය ඔස්සේ ඔබ වෙත ගෙන එනු ඇති බව එහි සංවිධායකවරු වන සාලිය ගලප්පත්ති හා නිහාල් තෙන්නකෝන් මහත්වරු නිවේදනය කරති.

ලක්බිම වෙබ් අඩවිය ඔබ සැමට නවතම අත්දැකීමක් වනු ඇති බව නිසැකය.